# පොලිස් මාධ්‍ය කොට්ඨාසය
## பொலிஸ் ஊடகப் பிரிவு
## POLICE MEDIA DIVISION
සෙත්සිරිපාය, බත්තරමුල්ල

තැ.පෙ.අංකය / த. பெ.இ / Po.Box No: 10120

ෆැක්ස් / தொலைநகல / Fax: 011-2171635

දුරකථන / தொலைபேசி / Telephone: 011-2887973 (HUNTING)

වෙබ්.ලිපිනය / இணையதளம் / Web Site: www.Police.lk

ඊ මේල් / மின்னஞ்சல் / E-mail: dir.media@police.gov.lk


මගේ අංකය / எனது இலக்கம் / My NO: 81 /2024

ඔබේ අංකය / உமது இலக்கம் / Your No: / 2024

දිනය / திகதி / Date: 17/01/2024 පැය 1300

**මාධ්‍ය නිවේදනය**

### අධිකරණ නියෝගයක් දැනුම් දීම.

2024.01.17 වන අද දින විරෝධතාකරුවන් පිරිසක් කුරුඳුවත්ත පොලිස් වසමේ විහාරමහා දේවි උද්‍යානය අසලින් විරෝධතාවයක් ආරම්භ කර ලිප්ටන් වටරවුම දක්වා පා ගමනින් පැමිණ සිනේසිටි සිනමා ශාලාව අසලින් කොටුව දුම්රියපොළ දක්වා පා ගමනින් ගොස් කොටුව දුම්රියපොළ ඉදිරිපිටදී විරෝධතාවක් පැවැත්වීමට නියමිත බවට මරදාන පොලිස් ස්ථානාධිපතිවරයාට ලද තොරතුරක් මත ඔහු විසින් එය තහනම් කරන ලෙසට අපරාධ නඩු විධාන සංග්‍රහයේ පවතින ප්‍රතිපාදන ප්‍රකාරව මාලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණයෙන් කරන ලද ඉල්ලීමට අනුව මලිගාකන්ද ගරු මහේස්ත්‍රාත් අධිකරණය මඟින් පහත සදහන් වග උත්තරකරුවන් වන

1. විතාරණගේ මධුෂාන් චන්ද්‍රජිත්
2. ගල්වැව සිරිධම්ම හිමි
3. මැදිරිගිරියේ ඉස්සරධම්ම හිමි
4. තිස්සපුර සිරි සුමේධ හිමි
5. අබ්දුල්ලා මොහෙමඩ් රිෆාත්
6. නිල්හවඩි ගෙදර මධුසංක චන්ද්‍රසිරි
7. සිංහලගේ තිලාන් මධුරංග ජයසිංහ
8. ඉමියාගේ නිසල දමිත්
9. එන්.කේ.ජී. ශලින්ද මිෂාන් සමරසිංහ

සමඟ සහභාගී වන තවත් අය වෙත, උද්ඝෝෂණකරුවන්ගේ නීත්‍යානුකූල සෙසු ක්‍රියාකලාපයන් මෙම අධිකරණය වෙතින් තහනම් නොකරන නමුත්, රෝහල් චතුරශ්‍රයට හා ඒ අවට පිහිටා ඇති රෝහල් වලට බාධා වන පරිදි කුලරත්න මාවත (මරදාන පාර), ඔරාබිපාෂා මාවත, සංඝරාජමාවත, ඩීන්ස් පාර (පූජ්‍ය බද්දේගම විමලවංශ හිමි මාවත), ඩාර්ලි පාර (ටී.බී.ජයා මාවත), රෝහල් චතුරශ්‍රය හා පිටත අවට ඇති මහා මාර්ගය, පදික වේදිකා භාවිතා කල නොහැකි ලෙස අහුරමින් මහජනතාව පීඩාවට පත් වන පරිදි සිදු කරන උද්ඝෝෂණ හා පෙළපාළි 2024.01.17 වන දින පැය 1100 සිට 2024.01.18 වන දින පැය 1100 දක්වා තහනම් කරමින් ආඥාවක් නිකුත් කර ඇත.